# වෘත්තිය සමිති ව්‍යාපාරයේ ඉදිරි දැක්ම පිළිබඳ අදහසක්

ලංකාවේ වැඩ කරන ජනතාව බරපතල ආර්ථික, සමාජ, දේශපාලන අභියෝගයන් රැසකට මුහුණ දී සිටින යුගයකට අවතීර්ණ වී සිටී. විශේෂයෙන්ම වර්තමාන රජය මුහුණ දී තිබෙන බරපතල ආර්ථික, සමාජ හා දේශපාලන අර්බුදය තුළ ඉන් ගොඩ ඒම සඳහා ඔවුන් අනුගමනය කරන උපාය මාර්ගය නිසාම පොදු ජනතාව කබලෙන් ලිපට වැටෙමින් සිටිති. විශේෂයෙන්ම අධික වන විදේශ ණය සම්භාරය සහ ඩොලරයේ සීඝ්‍ර සිදී යාම, රට තුළ විදේශ සම්පත් සිදී යාම, එසේම කොරෝනා වසංගතය පාලනය කිරීමේදී ආණ්ඩුව දැක්වූ අසමත් බව ආදිය නිසා විශේෂයෙන්ම ඉදිරි කාලය තුළ ජනතාවට පහර පිට පහර එල්ල කරන පියවරක් ආණ්ඩුවට අනුගමනය කිරීමට සිදු වී තිබේ.

නිදහස ලබා ගැනීමෙන් පසු මේ රටේ බලයට පත් වූ ආණ්ඩු, විශේෂයෙන්ම 1977 න් පසු බලයට පත් වූ ආණ්ඩු තමන්ගේ ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා දේශිය සම්පත් විදේශ ආයෝජකයන්ට විකිණීම සිරිතක් කොටගෙන තිබුණි. මෙයට විරුද්ධව දේශීය නායකත්වයක් ගොඩ නැගිය යුතුයි කියා බලයට පත් මහින්ද රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව ද ඒ සියලු පාලනයන් ඉක්මවා යමින් දේශීය සම්පත් විකිණීම ආරම්භ කර ඇත. ලංකාවට අති විශාල ධනස්කන්ධයක් ඉපයිය හැකි කොළඹ වරායේ බටහිර ජැටිය ඉන්දියානු ආදානි සමාගමට විකුණා ඇත. එසේම 1963 සිට ලංකාවේ ඒකාධිකාරයක්ව පැවති ඉන්ධන සුද්ධ කිරීම හා බෙදාහැරීම සහමුලින්ම පාහේ ඇමරිකානු සමාගමකට අයිති වන පරිදි පාර්ලිමේන්තුවේ නිතී සකසා ඇත. මෙයට අතිරේකව ගොවීන්ගේ ගොවි බිම් අහිමි කර මහා පරිමාණ ඉඩම් කොම්පැණිවලට විකිණීම කරගෙන යයි. මේ සම්බන්ධයෙන් කම්කරු පංතියෙන් එන විරෝධතාවයන් තුට්ටු දෙකකටවත් ආණ්ඩුව ගණන් ගන්නේ නැත.

එසේම රටේ ඉතිහාසයේ කවදාවත් නැති ප්‍රමාණයට අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යාම හා සේවකයන්ගේ පඩි වැඩි නොවීම ද, කොරෝනා මුවාවෙන් රැකියා අවස්ථා අහිමි වීම ද හේතු කොට ගෙන කම්කරු පංතිය ඇතුලු පීඩිත ජනතාවගේ ආදායම් දරුණු ලෙස කඩා වැටී ඇත. මෙම තත්වය තුළ ගොවීන්, ගුරුවරුන්, සෞඛ්‍ය සේවකයන් ඇතුලු විවිධ ක්ෂේත්‍ර තුලින් සැලකිය යුතු මට්ටමේ උද්ඝෝෂණ මාලාවක් ආරම්භ වී තිබේ. එසේම විශ්ව විද්‍යාල පුද්ගලීකරණය කිරීම, නිදහස් අධ්‍යාපනය වැනසීම සම්බන්ධයෙන් බරපතල උද්ඝෝෂණ මතුව ඇත.

මේ නිසාම ආණ්ඩුව කොරෝනා වසංගතයට මුවා වී පනවා ඇති හදිසි නීතිය හා නිරෝධායන නීති යොදා ගනිමින් වැඩ වර්ජන, උද්ඝෝෂණ, පෙළපාලි, රැස්වීම් සියල්ලම තහනම් කරන තත්වයකට ගමන් කර ඇත. එසේම ඉදිරි කාලයේදී ඉදිරි අයවැයෙන් රටේ ප්‍රධාන අත්‍යවශ්‍ය භාණ්ඩ මිල වැඩි වන ලකුණු දැනටමත් ප්‍රකාශයට පත් කර ඇත. විශේෂයෙන්ම හාල්, සීනි, ගෑස්, කිරිපිටි ආදී ජනතාවගේ අත්‍යවශ්‍ය සියලුම භාණ්ඩවල හිගයක් සමාජය තුළ ගොඩ නැගෙමින් තිබේ. මෙම තත්වය තුළ අප තේරුම් ගත යුත්තේ කම්කරු පංතියට ඉදිරි කාලය තුළ මුහුණ දීමට සිදු වන බරපතල අභියෝගයේ ප්‍රමාණයයි.

විශේෂයෙන්ම පසුගිය වසර කිහිපය තුළ මේ රටේ රාජ්‍ය අංශයේ හා පුද්ගලික අංශයේ කම්කරුවන්ට වැටුප් වැඩිවීම් හෝ වෙනත් දීමනා කිසිවක් ලැබී නැත. එසේම පොදු ජනතාව පාවිච්චි කරන භාණ්ඩ මිල ඉහළ යාමත්, කොරෝනා තත්වය මත ඔවුන්ගේ ආදායම් විශාල ලෙස පහළ වැටීමත් හේතුකොට ගෙන පොදු ජනතාවගේ ජීවිත ඉතාම අනාරක්ෂිත තත්වයකට පත්ව තිබෙන බව අප දනිමු.

මේ තත්වය තුළ කම්කරු පංතියෙන් මතු විය හැකි උද්ඝෝෂණයන් මැඩ පැවැත්වීම සඳහා මොවුන් හදිසි නීතිය උපයෝගී කර ගනිමින් දැඩි මර්ධනයක් දියත් කරගෙන යයි. පළමුව ආණ්ඩුව සාමකාමී උද්ඝෝෂණයන්ට පහර දුන්නේය. උද්ඝෝෂකයන් අත්අඩංගුවට ගත්තේය. කොතලාවල වෛද්‍ය පීඨ පනතකට විරුද්ධව පවත්වන ලද උද්ඝෝෂණයට සහභාගී වූ ශිෂ්‍ය නායකයන් හා වෘත්තීය සමිති නායකයන් ද පෙරටුගාමී පක්ෂයේ ක්‍රියාකාරී නායක සහෝදරවරුන් ද බොරු චෝදනා නගා අත්අඩංගුවට ගෙන අතිශය අමානුෂික ලෙස රඳවා තබා ගනිමින් කුමන්ත්‍රණකාරී ලෙස ඔවුන්ට ඇප ලබා දීම ප්‍රතික්ෂේප කර එම සහෝදරවරුන්ට පීඩා කරමින් සිටී.

එසේම අප තේරුම් ගත යුතුයි මෙම තත්වය තුළ විපක්ෂයේ පාර්ලිමේන්තුවාදී පක්ෂ සියල්ලම පාහේ ආණ්ඩුව අනුගමනය කරන මේ වැඩපිළිවෙලට විරුද්ධව බොරු කථා කිය කියා සිටිනවා මිස මේවාට විරුද්ධව පොදු ජනතාව පෙළ ගැස්සවීමේ කිසිම උත්සාහයක් නැත. ඒ නිසා මේ මොහොතේ අප තේරුම් ගත යුතුයි විපක්ෂයේ ප්‍රධාන දේශපාලන පක්ෂ ආණ්ඩුවට අනියම් ආකාරයට සහය දීමේ ස්ථාවරයක සිටින බව. එයට හේතුව වන්නේ ඔවුන් කල්පනා කරන්නේ ජනතාව අතිශය පීඩානයකට ලක් වුණාම, ජනතාව ඇති වෙන්න බැට කෑවාම එහි ප්‍රතිඵලයක් විදියට අනිවාර්යයෙන් ඊළඟ ඡන්දයේදී ඔවුන්ට බලයට පත්වීමට හැකිවනු ඇතැයි කියාය. මෙය මනෝරාජික සිහිනයකි. එතෙක් කම්කරු පංතියට හා පොදු ජනතාවට බලා සිටින්න පුලුවන්කමක් නැත. ඒ නිසාම ඔවුන් විවිධ උද්ඝෝෂණයන්ගේ යෙදෙන එක අපට වැළැක්විය නොහැක.

<u>වෘත්තීය සමිති</u>

මේ අතර අවාසනාවන්ත තත්වය නම් වෘත්තීය සමිති ව්‍යාපාරය මුහුණ දී ඇති තත්වයයි. ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරය මැත භාගය තුළ විශේෂයෙන්ම දේශපාලන පක්ෂවල ඒ හෝ මේ බලපෑමට යටත්ව දේශපාලන පක්ෂ විසින් හසුරුවන වැඩපිළිවෙලක් මත ක්‍රියාත්මක වීම කණගාටුදායකය. ප්‍රධාන සමිති කිහිපයක් හැරුණු විට බොහෝ සමිති සම්මේලන ප්‍රධාන දේශපාලන පක්ෂවල මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වේ. මෙහි ප්‍රතිඵලයක් හැටියට කම්කරු පංතියට එක්සත් උද්ඝෝෂණයක් හෝ එක්සත් වැඩපිළිවෙලක් මත මේ ආණ්ඩුවේ මර්ධනය මුහුණ දීමට හැකි වී නොමැති බව අප තේරුම් ගත යුතුය.

ඒ නිසා සහෝදර සහෝදරියනි, දැනටමත් විවිධ ගොනු යටතේ වෘත්තීය සමිති පෙළ ගැසී තිබේ. සමහර වෘත්තීය සමිති සන්ධාන පවතින්නේ ඒ ඒ නිශ්චිත කාරණාවන් සම්බන්ධයෙන් ඇතිවන ඇති කර ගන්නා පෙරමුණු හැටියටය. සමහර ඒවා සෞඛ්‍ය සේවයේ සටනට සීමා වී ඇත. සමහර ඒවා ගුරු සටනට සීමා වී ඇත. නමුත් සමස්ත ආණ්ඩුවේ වැඩපිළිවෙල තුළ වෘත්තීය සමිති මුහුණ දෙන මේ බරපතල අභියෝගයට මුහුණ දීමට අවශ්‍ය දේශපාලන මඟ පෙන්වීමක් වෘත්තීය සමිති ව්‍යාපාරයෙන් නොලැබීම අතිශයින්ම කණගාටුදායකය. මෙහිදි යම් සාර්ථක උත්සාහයක් දරමින් සිටින්නේ දැනට බැංකු සේවක සංගමය CMU වැනි සංවිධාන මූලිකත්වයෙන් ගොඩ නගා ගෙන ඇති පොදු දේපල හා මානව හිමිකම් සුරැකීමේ සංවිධානයේ ක්‍රියාකාරීත්වයයි. එයද ප්‍රමාණවත් පරිදි ශක්තිමත් විදියට උද්ඝෝෂණයන් ලෙස ඉදිරියට අපි අපොහොසත්ව සිටිමු. ඒ සඳහා පවතින බාධකය වන්නේද එක් පැත්තකින් පවත්නා හදිසි නීතිය හා අපගේ වෘත්තීය සමිති නායකත්වයන්ගේ පවත්නා එක්තරා විදියක පහළ සමාජයෙන් එන පීඩනයට ඔවුන් ද හසු වී තිබීම විය හැකිය. මේ තත්වය මේ ආකාරයට පැවතුණොත් ඉදිරි කාලයේදී ලංකාවේ බැංකු ටික ද පුද්ගලීකරණය වනු ඇත. එසේම තැපැල් සේවය දැනටත් විකුණා දැමීමට පිඹුරුපත් සකසමින් සිටී. පුද්ගලික අංශයේ කම්කරුවන්ගේ ජීවිත දරුණු ලෙස කඩා වැටීමට ලක්ව තිබේ. මේ සියලු කරුණු සලකා බැලීමේදී අද කම්කරු, ගොවි ජනතාව මුහුණ දෙන ප්‍රධාන අභියෝගය ධනේශ්වර දේශපාලනය පරාජය කොට වැඩ කරන ජනතාවගේ දේශපාලනයක් මතු කර ගැනීමට වෘත්තීය සමිති ව්‍යාපාරයට පවා නොහැකි වී තිබීමයි. මෙම තත්වය දිගටම පැවතිය හොත් නැවත වතාවක් ධනපති පංතියේ කොටසකට කම්කරු පංතිය හා පීඩිත ජනතාවගේ ජීවිත බිලි ගැනීමට අවස්ථාවක් ලැබෙනු නොඅනුමානය.

මෙම සියළු කරුණු සැලකිල්ලට ගෙන අපි මනාව තේරුම් ගත යුතුයි වෘත්තීය සමිති ව්‍යාපාරය ඉහත කී තේමාවන් මුල් කර ගනිමින් පොදු අරගලයකට කම්කරු පංතිය කැඳවන උද්ඝෝෂණයන් කරා අපි අඩියෙන් අඩිය පියවරෙන් පියවරට යා යුතු බවයි. එසේ නොමැතිව තැනින් තැන මතුවන අරගලයන් සඳහා පෙරමුණ ගොඩ නගා ගෙන කරන කටයුතුවලින් සිදුවන්නේ අන්තිම වශයෙන් මේ ව්‍යාපාරය මැද්දට පැන ගන්නා අන්තිම අවස්ථාවාදී ධනේශ්වර දේශපාලන පක්ෂ මේ ව්‍යාපාරයන් තමන්ගේ අතට අරගෙන අනාගතයේ එන මැතිවරණවලදී තමන්ගේ සාක්කුවට දමා ගැනීමටය. මෙය ඉතාම භයානක තත්වයකි. අපි ඉතා පැහැදිලිව කියා සිටින්නේ මේ අවස්ථාවේ කම්කරු පංතියේ වැඩපළවල්වල අපගේ සාමාජිකයන් දැනුවත් කරමින් අනෙකුත් වෘත්තීය සමිති නායකයන්ටත් යම් බලපෑමක් එල්ල කරමින් පංතිය තුළ ඉතාම ඒකාබද්ධ මතවාදයක් උඩ ඒකාබද්ධ ඉල්ලීමක් උඩ මේ රටේ පංතිය ඉදිරියට ගෙන ඒමට කටයුතු කළ යුතු බවයි.

<u>දෙවන කොටස</u>

වැඩකරන පන්තියට පවතින මෙම අර්බුදයට විසඳුම් දිය නොහැකි ද?
පවතින සමාජ දේශපාලන අර්බුදය කවුරුන් විසින් විසඳණු ඇතිද?
වැඩකරන පන්තිය තුළ එයට විසඳුම් නැතැයි ද?
අති බව වැඩ කරන පන්තිය යනු කවුරුන්ද?

ශාරීරික හෝ බුද්ධිමය ශ්‍රමය විකුණන සියලු දෙනා ඇතුළු ගොවියා, ධීවරයා යනු අති බහුතර වැඩකරන පන්තියයි. මේ සියලු දෙනා පවතින දේශපාලන අර්බුදය තුළ පීඩනයට පත්ව නො සිටී ද? බියට පත්ව සිටින්නේ නම් ඔවුන්ට එක් වීමට ඇති බාධාව කුමක්ද? ඔවුන්ට තවදුරටත් පවතින නව ලිබරල් දේශපාලනඥයින් ශක්තිමත් කොට පවතින අර්බුදයෙන් ගොඩ ආ හැකිද? නව ලිබරල්වාදය යනු අතේ ඇඟිලි වලින් ගණන් කළ හැකි කිහිප දෙනෙක් වටා මුදල් ගොඩගසා ගැනීම සඳහා වූ වැඩපිළිවෙළ නොවේද? මෙම මුදල් ගොඩගසා ගන්නා පුද්ගලයින්ට ඉතාම ආසන්න ඔවුන් වෙනුවෙන් දිවා රෑ වෙහෙසෙන, ඔවුන් වෙනුවෙන් අති බහුතර වැඩකරන පන්තිය වහලුන් කිරීමේ ක්‍රියාදාමයට සහයෝගය දෙන ඉහළ මධ්‍යම පාන්තික හෝ මධ්‍යම පාන්තිකයින්ට පවතින සමාජය සුවදායක ද? සුරක්ෂිතද? මාරාන්තික කොවිඩ් වසංගතය පවා නව ලිබරල් වාදයේ නිර්මාණයක් විය නොහැකිද? ඒ තුළ සුරක්ෂිත වී ඇත්තේ කවුරුන්ද?

නව ලිබරල්වාදී ධනවාදය සමාජයේ අති බහුතරය අනාරක්ෂිත කොට පීඩනයට පත් කරයි නම්, ඉච්ඡාභංගත්වයට පත් කරයි නම් මෙම අති බහුතරයට ධනවාදය ප්‍රතික්ෂේප කළ නොහැක්කේ ඇයි? අතේ ඇඟිලි ගණනට සමාන සුළුතරයක් වෙනුවෙන් නිර්මාණය කර ඇති ධනවාදය වෙනුවට මානව හිතවාදී පරිසර හිතවාදී එකිනෙකාගේ අවශ්‍යතාවයන්ට ගරු කරන ලෝක පරිමාණ සමාජ විමුක්තියකට යෑමට ඇති බාධක මොනවාද?

1. ධනවාදී පක්ෂයක අඳුරු සෙවණැලි ශෝධනය කිරීමට තවත් ධනවාදී පක්ෂයක් බලයට පත් කරන්නේ පීඩිත අති බහුතර අපි ම නොවේද? ඒ නිරුවත් පසුපස දිව යෑම නොවේද? අපි මේ දිනවන්නේ ලෝක අධිරාජ්‍යවාදීන්, ඔවුන්ගේ හෙංචයියන් නොවේද?

2. සමාජ විමුක්තියේ පරිසර හිතකාමී දේශපාලනයක් රට තුළ ස්ථාපිත නොවීමට ප්‍රධාන හේතු මොනවාද? වාමවාදී දේශපාලන පක්ෂ සීඝ්‍රයෙන් ඉහළට විත් තියුණු පරාජයන් අත්කර ගත්තේ ඇයි? දක්ෂිණාංශික දේශපාලන පක්ෂ සමඟ සංධානගත වීමට ගොස් තම පක්ෂ විනාශ වී ගියා නොවේද? සමසමාජ පක්ෂය හා ජවිපෙ මේ සඳහා උදාහරණ නොවේද? අතීතයේ විමුක්තිවාදී දේශපාලනයක නියැළුණු ප්‍රබල දේශපාලන චරිත පොට වරද්දාගෙන දක්ෂිණාංශික දේශපාලනඥයන්ගේ අතකොලු ලෙස අදත් කටයුතු නොකරන්නේ ද?

3. දක්ෂිණාංශික දේශපාලන පක්ෂ සමග තරගයේ දී වාමාංශික ප්‍රතිපත්ති වෙනුවට ජනප්‍රියත්වය පසුපස බඩගා යමින් තමන්ගේ ප්‍රතිපත්ති වලට පවා පටහැනිව කටයුතු නොකරන්නේ ද? ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් වාමවාදී යැයි කියාගන්නා පක්ෂ වල අතීතය පසුවිපරම් කිරීමේ යෙදීමේදි මේ බව තහවුරු නොවන්නේ ද?

4. වැරදි ස්ථානවල හා වැරදි ප්‍රතිපත්ති වල සිටින සියලුම වාමවාදී දේශපාලනඥයින්ට අවම වශයෙන් සටනකදී වත් එක්වීමට ඇති බාධාවක් තිබේද? එය ජය ගන්නේ කෙසේද? වියත් මග මේ වන විට පිළුණු වී නැතිද? තවත් උගත් මගකින් ද මෙයට වඩා වෙනස් දෙයක් සිදු වේ යැයි බලාපොරොත්තු විය හැකිද?

5. වත්මන් සමාජ දේශපාලන ගැටළුවට විසඳුම 2015 පන්නයේ වම-දකුණ එකතුවක්ද සමිති බහුජන සංවිධාන නැවත වරක් එවන් ගොදුරකට ආසන්න වෙමින් නොසිටින්නේ ද? එසේ වුවහොත් බිහිවන ධනවාදී වම මිශ්‍ර කඳවුර පවතින සමාජ දේශපාලන අර්බුදය විසඳීමට සමත් වේද? සම්පත් පුද්ගලීකරණය නවතීද? රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප යළි ලබා දේද? මහ බැංකු මංකොල්ලය, සීනි වංචාවන් ඇතුලු සියලු දූෂිතයන් නීතිය හමුවට ගෙනවිත් මහජන දේපලවල වටිනාකම නැවත ලබා ගනීද? විදේශිකයින්ට රාජ්‍ය දේපල විකිණීම නතර කරයිද? ඔවුන් විසින් ගෙන එන නිදහස් අධ්‍යාපනය වැනසීමේ කොතලාවල පනත හකුළා ගනී ද? පරිසර විනාශය වළකයිද? ලෝකයේ වැඩිම පොහොර හා කෘමිනාශක භාවිතා කොට මිනිසා ඇතුළු සියලු ජීවීන්ට ද මහපොළොව වස කැවීම නතර කරයිද ?

වෘත්තිය සමිති එකමුතුවකට පැන නැගී ඇති සමාජ, දේශපාලනික ගැටලුවලට විසඳුම් විය හැකිද? වෘත්තිය සමිති අති බහුතරය අද කරමින් සිටින්නේ ධනපති පංතියෙන් සොච්චමක් වැඩකරන පන්තියට ඉල්ලා හෝ උදුරා දීමක් නොවේද? වෘත්තිය සමිති කිසිවක් රට හෝ මහජනතාව සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්නා ස්ථානවල සිටින්නේද? එසේනම් වෘත්තීය සමිති විසින් ද ස්වාධීන යැයි කියමින් තම සාමාජිකත්වය දේශපාලන අධිකාරියෙන් යමක් ඉල්ලා යදින්නන් එසේත් නොමැති නම් සමාජ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටීම නොවේද? ප්‍රතිසංස්කරණය යනු පවතින ක්‍රමයේම වෙනසක් නොවේද? සියවස් ගණනාවක් ගියද ප්‍රතිසංස්කරණ හරහා පන්තියේ සමාජ දේශපාලන ගැටලු වලට විසඳුම් ලැබුණේද?

එසේනම් අති බහුතර වැඩකරන පන්තිය සියලු බැම් ලිහා දමා එක් විය යුත්තේ කුමක් සඳහාද?

1. ගොවියාගේ, ධීවරයාගේ නිෂ්පාදන ගලවා විධිමත් සමූපකාර ක්‍රමයක් ගොඩනැගිය යුතු නොවේද?

2. කුමන්ත්‍රණකාරී අධිරාජ්‍යවාදී ගැටවලට හසු නොවී සමස්ත වැඩකරන පන්තිය එයින් මුදවා ගැනීම නොවේද?

3. වර්ග භේද, ආගම් භේද, කුල භේද වපුරමින් බලයට පැමිණෙන සිංහල, දෙමළ, මුස්ලිම් කුඨ දේශපාලනඥයින්ට හසු විය යුතුද?

4. නිදහස් අධ්‍යාපනය නිදහස් සෞඛ්‍යය ආරක්ෂා කොට ජනතා ජීවන තත්වය වර්ධනය කළ යුතු නොවේද?

5. නිදහස් වෙළඳ කලාප ඇතුළු සියලු තැන්හි සිදුව සිදු වන ශ්‍රම සූරාකෑම, අනියම් මැන් පවර් සේවක වලටත් තිත තැබිය යුතු නොවේද?

6. වයස 60 ඉක්මවන ජ්‍යෝෂ්ඨ පුරවැසියන් ආහාර, සෞඛ්‍යය අවශ්‍යතා වෙනුවෙන් දියුණු රටවල මෙන් කිසිවකුටත් අත නොපා ජීවත්වීමට අවස්ථාව සැලසිය යුතු නොවේද?

7. සියළු අනියම් සේවකයන් ස්ථිර කළ යුතු නොවේද?

8. ජීවන වියදමට සරිලන වැටුප් වැඩිවීමක් හා වැටුප් ක්‍රමයක් ලබා දිය යුතු නැද්ද?

මේ සඳහා අප සියලුදෙනා හට වගකීමක්, වගවීමක් තිබේද? එසේ නම් තවදුරටත් විනාශකාරී කඳවුරුවල සිට තම හිස තම අතින්ම සිඳලා ගැනීමට කටයුතු කරන්නේ ඇයි? වැඩ කරන පන්තිය කොන්දේසි විරහිතව එකට එක්විය යුතු නොවේද? ගොවීන්, ධීවරයින් කම්කරුවන්, ශිෂ්‍යයින් විසින් අද අදම මේ සඳහා පෙළ ගැසිය යුතු නොවේද? වැඩ කරන ජනතාවගේ දේශපාලන බලයක් ගොඩ නැගීම තුළින් පංතියේ විමුක්තිය දිනා ගනිමුද?

- සමාජවාදී ජනතා පක්ෂය -
- වෘත්තීය අංශය -